# ශ්‍රී ලංකා වරාය අධිකාරිය
## දැන්වීමයි

මගේ අංකය: මාසකො/විධා/05/10(i)

පහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති තම තනතුරේ ස්ථිර වූ මෙම අධිකාරියේ සේවකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා 2024-07-17 දින පළකරනු ලැබූ දැන්වීම් මින් අවලංගු කරන අතර, එම දැන්වීම් අනුව අයදුම්කල අයදුම්කරුවන්ද නැවත අයදුම් කළ යුතු වේ.

<u>**තනතුර : කණිෂ්ඨ කළමනාකරු (පරිගණක සේවා) – JLM (කණිෂ්ඨ කළමනාකරණ මට්ටම)**</u>

I. වැටුප් කාණ්ඩය : 5 : 0 (JLM)
 මූලික වැටුප : රු. 75,065/=
 වැටුප් වර්ධකය : රු. 1,440/=

II. **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් භෞතික විද්‍යාව/ ගණිතය/ තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් හෝ පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව විෂයයක් සහිතව හැදෑරූ උපාධියක්

**හෝ**

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් සහ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් (ඩිප්ලෝමාව කාල සීමාව වසර එක (01) ක් විය යුතුයි)

**සමඟ**

**පළපුරුද්ද**
ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වසර තුන (03) ක සක්‍රිය සේවා කාලයක් සපුරා තිබීම

**හෝ**

(ආ) **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**
පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් (ඩිප්ලෝමාව කාල සීමාව වසර එක (01) ක් විය යුතුයි)

**සමඟ**

**පළපුරුද්ද**
ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වසර දහය (10) ක සක්‍රිය සේවා කාලයක් සපුරා තිබීම

**හෝ**

(ඇ) **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**
දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/ දෙමළ භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස (සා/පෙළ) සමත් වී තිබීම.

**සමඟ**

**පළපුරුද්ද :**
අදාල ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්ද සහිත ශ්‍රී ලංකා වරාය අධිකාරියේ SG වැටුප් කාණ්ඩයේ සිටිය යුතුය.

සටහන 01 :
කාර්ය සාධන ඇගයීම සතුටුදායක මට්ටමක තිබිය යුතුයි.

**(අවශ්‍ය වුවහොත් සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට භාජනය කරනු ලබන අතර, විෂය නිර්දේශය පසුව දැනුම් දෙනු ලැබේ.)**

...02 පිටුවට

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ මින් ඉදිරියට සම්පාදනය කරනු ලබන හෝ සියළුම නීති රීති වලට අනුකූලව පත්වීම් ලබන්නන් කටයුතු කළ යුතු වේ.

තෝරාගත් අපේක්ෂකයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය වන පරිදි දිවයිනේ ඕනෑම පෙදෙසක හෝ අධිකාරියේ ඕනෑම කොට්ඨාශයක/ අංශයක සේවය කිරීමට බැඳී සිටී.

ආදර්ශ ආකෘතිපත්‍ර ප්‍රකාරව සකසන ලද අයදුම්පත් 2026-11-10 වෙනි දින හෝ ඊට පෙර ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන) වෙත ලැබෙන සේ අදාළ කොට්ඨාශ/ අංශ ප්‍රධානියා මගින් එවිය යුතු වේ. ඒ සමඟ අධ්‍යාපන හා වෘත්තීය සහතිකවල පිටපත්ද අමුණා එවිය යුතු අතර, අදාළ සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් හා මෙම දැන්වීමේ අවශ්‍යතාවයන්ට සෑම අයුරින්ම අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

නියමිත දිනෙන් පසුව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රමාදවීමට තුඩුදුන් කරුණු අදාළ කොට්ඨාශ ප්‍රධානීන් විසින් හෝ සඳහන් කළයුතු අතර, එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන)

2026-10- 16 වෙනි දින.

මානව සම්පත් හා පරිපාලන කොට්ඨාශයේදීය.